අධ්‍යාපන අමාත්‍යාංශය
ජාතික භාෂා හා මානව ශාස්ත්‍ර ශාඛාව
සිංහල භාෂා ඒකකය



# සිංහල භාෂාව හා සාහිත්‍ය තරගාවලිය 2023
## පළාත් මට්ටම

01. අපේක්ෂකයාගේ නම : ..........................................................................................................
(මුලකුරු සමග නිවැරදි ව ලියන්න.)

02. විදුහලේ නම සහ ලිපිනය : ...............................................................................................

03. පාසල් වර්ගය : 200ට අඩු /201 - 500 තෙක් / 500ට වැඩි

04. කලාපය : ...........................................................................................

05. පළාත : ..............................................................................................

## ගද්‍ය රචනා හා ප්‍රායෝගික ලේඛන

7 ශ්‍රේණිය

කාලය පැය 02යි.

I කොටසින් එකක් ද II කොටසේ (අ) යටතේ එකක් ද (ආ) යටතේ එකක් ද (ඉ) යටතේ එකක් ද වශයෙන් ප්‍රශ්න හතරකට පිළිතුරු සපයන්න.

### I කොටස

1. පහත දැක්වෙන මාතෘකාවලින් එකක් තෝරා ගෙන වචන 150-200 අතර රචනයක් ලියන්න.
   (අ) විද්‍යුත් අපද්‍රව්‍ය නිවැරදිව කළමනාකරණය කරමු
   (ආ) ආදර්ශවත් වැලිවිට සරණංකර සඟරජ හිමිපාණෝ
   (ඇ) ඉගෙනුමෙන් දිවිය සරු කර ගනිමු
   (ඈ) සුන්දර වනපෙත ගෙනෙයි නෙක අසිරිය
   (ඉ) ශ්‍රී ලංකාවේ අභිකුණ්ඨික ජන දිවිය

(ලකුණු 40යි.)

### II කොටස

අ. (i) ඔබ පාසලේ ප්‍රධාන දොරටුව ආසන්න මාර්ගයේ කානු පද්ධතිය බලවත් ලෙස කැඩී බිඳී ගොස් ඇත. බොහෝ පිරිසක් නිරන්තරයෙන් ගැවසෙන ස්ථානයක් බැවින් එහි අනතුරු සිදුවීමේ අවදානමක් පවතියි. එය ඉක්මනින් පිළිසකර කර දෙන මෙන් ඉල්ලමින් රථවාහන නියාමන සංගමයේ ලේකම්, ප්‍රාදේශීය මාර්ග සංවර්ධන අධිකාරිය වෙත යවන ලිපිය ලියන්න.

(ii) පාසලේ පරිසර සංවිධානයේ සාමාජික සාමාජිකාවෝ දියසරු උද්‍යානයේ ජෛව විවිධත්ව නිරීක්ෂණ චාරිකාවක් යාමට අදහස් කරති. ඒ පිළිබඳ විදුහල්පතිතුමා දැනුවත් කිරීමටත්, අවසර ලබා ගැනීමටත් සුදුසු ලිපියක් ලියන්න.

(ලකුණු 20යි.)

ආ. (i) පුබුදු ළමා සමාජයේ සාමාජික සාමාජිකාවන් මෙවර සිංහල අලුත් අවුරුද්ද නිමිති කොට ගෙන අවුරුදු පොළක් පැවැත්වීමට සැලසුම් කර ඇත. ඒ පිළිබඳ ප්‍රදේශවාසීන් දැනුවත් කිරීමට සුදුසු දැන්වීම් පත්‍රිකාවක් පිළියෙල කරන්න.

(ii) මෙවර අ. පො. ස (සා. පෙළ) විභාගයට පෙනී සිටි සිසුන් වෙනුවෙන් වෘත්තීය පුහුණු වැඩසටහනක් පැවැත්වීමට වෘත්තීය පුහුණු අධිකාරිය කටයුතු සංවිධානය කර ඇත. ඒ සඳහා දැනුවත් කිරීමට සුදුසු දැන්වීම් පත්‍රිකාවක් සකස් කරන්න.

(ලකුණු 20යි.)



Downloaded from Past Papers Wiki - Extensive collection of Past papers, Notes and much more! CamScanner

ඉ. (i) ඔබ පාසලේ පරිසර නියමුවන්ට පදක්කම් පැලඳවීමේ උත්සවයක් දිස්ත්‍රික් පරිසර කොමසාරිස්ගේ ප්‍රධානත්වයෙන් පැවැත්වීමට සැලසුම් කර ඇත. එම අවස්ථාවට සහභාගි වන මෙන් දන්වමින් ආරාධිතයන් වෙත යවන ආරාධනා පත්‍රය සකස් කරන්න. සංගමයේ ලේකම් ඔබ යැයි සිතන්න.

(ii) ඔබ විදුහලේ බොහෝ කාලයක් සේවය කර , මෑතක දී ස්ථාන මාරුවක් ලැබූ ඔබේ සිංහල විෂය ගුරුතුමිය මෙවර ගුරු උපහාර උළෙලේ දී ඇගයීමට පාත්‍රවීමට නියමිත ය. ඒ පිළිබඳ ඔබගේ සතුට පිරිනමමින් සුබ පැතුම් පතක් නිර්මාණය කරන්න.

(ලකුණු 20යි.)

PAST PAPERS
WIKI

(2) WWW.PastPapers.WiKi (2)

CamScanner